**ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**1.6.**1 **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

------------------------

**(අ)** **පුනරාවර්තන වියදම්**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | --------------------------------------- | ---------- |
| (i) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වශයෙන් රු.518,695,940 ක් දක්වා තිබුණද ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව එම වියදම රු.538,024,050 ක් වී තිබුණි. ඒ අනුව රු.19,328,110 ක වෙනසක් විය. | අයවැය ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් යටතට ගැනෙන සියලු වියදම් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස සටහන් කල බවත් ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම් සඳහා දරනු ලබන වියදම් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කිරීම ගැටළුකාරී බව දන්වමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුනරාවර්තන වියදම්වලට අදාළ මුදල් ගලා යාම් නිවැරදිව හඳුනාගත යුතු වේ. |
| (ii) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වැය කරන ලද මුදල් ප්‍රවාහයේ සහනාධාර හා මාරු කිරීම් යටතේ කිසිඳු ගෙවීමක් දක්වා නොතිබුණු අතර ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව එය රු.2,185,375 ක් විය. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සහනාධාර හා මාරු කිරීම් යටතේ දැක්වීමට කටයුතු කරන බව දන්වමි. | -එම- |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වශයෙන් රු.214,770,638 ක් දක්වා තිබුණද ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව එම වියදම රු.193,257,154 ක් වූයෙන් රු.21,513,484 ක වෙනසක් විය. | අයවැය ඇස්තමේන්තුව අනුව ප්‍රාග්ධන වියදම් යටතට ගැනෙන සියළු වියදම් සටහන් කරන ලද බව දන්වමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ප්‍රාග්ධන වියදම්වලට අදාළ මුදල් ගලා යාම් නිවැරදිව හඳුනාගත යුතු වේ. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම්වල අවසාන ශේෂ වශයෙන් රු.5,825,821,387 ක් දක්වා තිබූ නමුත් භාණ්ඩාගාර සටහන් අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසාන ශේෂය රු.5,681,980,290 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව රු.143,841,097 ක වෙනසක් වූ අතර වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වත්කම්වල අගය භාණ්ඩාගාර සටහන් සමඟ සසඳා නිවැරදි අගය ගිණුම්ගත කල යුතු වේ. |

**1.6.3 තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත්කරුවෙකුගෙන් ලබා ගෙන තිබුණු රු.899,710 ක කාර්ය සාධන සුරක්ෂණයක් 2018 දෙසැම්බර් මාසයේදී මුදල් කර ගෙන තිබුණු අතර එම වටිනාකම රාජ්‍ය ආදායමට බැර කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | 2021 මැයි මස ගිණුම් සාරාංශය මඟින් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව දන්වමි. | මෙම වටිනාකම රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | තැබිය යුතු ඇප මුදල් ප්‍රමාණය තීරණය කිරීමට කමිටුවක් පත්කර ඇති බවත්, ඉදිරියේදී එම කමිටු තීරණය මත ඇප තැබීම සිදුකර ඇප ලේඛනය පිළියෙල කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 08 ක සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | රට තුළ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් සත්වෝද්‍යාන නරඹන්නන් සඳහා වසා පැවතීමත් අයවැය චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට සිදු වීමත් මත මෙම ඉතිරි කිරීම් සිදු වූ බව දන්වමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලසුමකින් හා කළමනාකාරීත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතු වේ. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව | 2021 තෙවන කාර්තුවේ සිට මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත් කල දින සිට වර්ෂ දෙකක් ඉක්ම වූ රු.21,621,561 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී හිමිකම් නොපාන තැන්පතු රජයේ ආදායමට බැර කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනතේ 37 වගන්තිය | භාවිතා කරනු ලබන කිරුම් මිනුම් උපකරණ නිසි පරීක්ෂාවකින් තොරව හා මුද්‍රා තැබීමකින් තොරව භාවිතයට ගැනීම වරදක් වුවත් දෙහිවල සත්වෝද්‍යානයේ ගබඩාවේ ඇති ධාරිතාවය කිලෝග්‍රෑම් 150 ක් වූ මස්වල බර කිරීම සඳහා භාවිතා කරනු ලබන ඉලෙක්ට්‍රොනික් කිරුම් යන්ත්‍රය 2013 වර්ෂයෙන් පසු මුද්‍රා තබා නොතිබුණි. ඒ අනුව එම තරාදිය අනුමත දෝෂය ඉක්මවා බර අඩුවෙන් | මෙම තරාදි නැවත අංකනය කර ගැනීම සඳහා අදාළ අංශ වෙත ලිඛිතව හා දුරකතනයෙන් දැනුම් දී ඇත. මේ වන තෙක් මෙම තරාදි මිණුම් නිවැරදි කිරීම සඳහා අදාළ ආයතනය කටයුතු නොකළ බවත් ඉදිරියේදී සිහි කැඳවීම් කිරීමට අපේක්ෂා කරන බවත් දන්වමි. | කිරුම් මිණුම් උපකරණ සඳහා විධිමත් පරීක්ෂාවක් සහ මුද්‍රා තැබීමක් සිදු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සටහන් වන බව කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ පරීක්ෂාවේදී නිරීක්ෂණය වී තිබූ නමුත් මේ වන තෙක් එය නිවැරදි කර නොතිබුණි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ එළඹ තිබූ ගිවිසුම් අනුව 2018 වර්ෂය අවසන් වන විට වැඩ අවසන් වීමට නියමිතව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.223,151,303 ක් වූ ව්‍යාපෘති 09 කට අදාල ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂය අවසන් වන විට නිම නොකර අත්හැර දමා තිබුණි. මේ සඳහා රු.88,905,549 ක් අදාල ආයතනය වෙත ගෙවා තිබුණි. | මෙම ඉදිකිරීම් කටයුතු ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ප්‍රදානය කර තිබූ බවත් කොන්ත්‍රාත් කටයුතුවල ප්‍රමාදවීම් නිසා ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා ලිපි අදාළ ආයතනය වෙත නිකුත් කර ඇති බවත් දන්වා ඇත. | නිම නොකර අත්හැර දමා ඇති මෙම ඉදිකිරීම් කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018, 2019 වර්ෂවලදී නිම කිරීමට නියමිතව තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු.257,672,853 ක් වූ ව්‍යාපෘති 05 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදීද නිමකර නොතිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.208,921,963 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | ඉදිකිරීම් කටයුතු කරන අතර තුර සැලසුම වෙනස් කිරීමට සිදුවීම, ඉදිකිරීම් කටයුතු සිදුවන කාලය තුළ කොරෝනා වසංගත තත්ත්වය ඇතිවීම සහ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් සිදුවීම වැනි හේතු නිසා ව්‍යාපෘති ඉටු කිරීමේ මෙවැනි ප්‍රමාදන් සිදු වූ බව දන්වා ඇත. | කඩිනමින් ඉදිකිරීම්වල වැඩ අවසන් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පින්නවල අලි අනාථාගාරයේ අලින් රඳවා සිටින ස්ථාන අසල අලි වසුරු හා ඉතිරි වූ ආහාර කොටස් ගොඩ ගසා තිබූ බැවින් පරිශ්‍රය අපවිත්‍රව පැවතුණි. | මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා කුණු අඹරණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අපේක්ෂිත අතර එමඟින් අලි වසුරු හා කුණුරොඩු කුඩා කැබලි කර කොම්පොස්ට් පොහොර ලෙස ඉඩම් සංවර්ධන කටයුතු සඳහා ලබාදීමට අපේක්ෂිත බව දන්වමි. | අලි වසුරු හා ඉතිරි වූ ආහාර කොටස් ඉවත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් යෙදිය යුතු වේ. |
| (ආ) | පශු වෛද්‍යවරුන් විසින් සතුන්ට ලබාදීමට නිර්දේශ කරනු ලබන ආහාර මැනීමකින් තොරව අත්දැකීම් හා පළපුරුද්ද මත ලබා දෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව ආහාර නියමිත ප්‍රමාණයම ලබා දෙනවාද යන්න තහවුරු කර ගත නොහැකි විය. | සතුන් සංඛ්‍යාව සහ පෝෂණ අංශයේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව මත සෑම ආහාරයක්ම කිරා සියළුම සතුන් වෙත ලබාදීම ප්‍රායෝගිකව අපහසු බවත් ඉදිරියේදී ප්‍රායෝගික මිණුම් දඬු යොදා ගැනීමට තීරණය කර ඇති බවත් දැනුම් දී ඇත. | විද්‍යාත්මක මිණුම් දඬු මත පදනම්ව සතුන්ගේ දෛනික ආහාර අවශ්‍යතාවය තීරණය කල යුතු වේ. |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ ගෝනපළ ගොවිපල තුල වගා කිරීමේ කටයුතු නිසි සැලැස්මකට අනුව සිදු කර නොතිබුණි. එහි වගාව වැඩි කර බාහිර ආයතනයන්ගෙන් මිලදී ගන්නා සත්ව ආහාර ප්‍රමාණය අඩු කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ගොවිපළ තුළ තණකොළ, කංකුං, කෙසෙල් හා උක් ගස් වගා කරනු ලබන අතර ඉදිරියේදී ගොවිපළ සඳහා අවශ්‍ය කම්කරුවන් සංඛ්‍යාව බඳවා ගෙන වගා කටයුතු වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන බව දන්වමි | ගොවිපළ තුළ වැඩි ඵලදාවක් ලැබෙන ආකාරයට නිසි සැලසුමක් අනුව වගා කටයුතු කළ යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු 170 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 4 ක හා ද්විතික මට්ටමේ තනතුරු 33 ක පුරප්පාඩු පැවතුණි. | මේ පිළිබඳ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවත් ඉදිරියේදී එම කටයුතු කඩිනමින් ඉටු කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වමි. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |